ස/අයි/15/07

2013/12/31

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

සමෘද්ධි සහකාර කොමසාරිස්/දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ

**ප්‍රාදේශීය ලේකම්/** ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ

දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි

මහ සංගම් කළමණාකරුවන් සහ බැංකු කළමණාකරුවන් වෙත

**<u>සමෘද්ධි මහ සංගම් හි පොදු ලෙජරය හා ශේෂ පරීක්ෂණ සදහා නිශ්චිත</u>**

**<u>කේත අංක ක්‍රමයක් හදුන්වා දීම තුලින් පොදු ආකෘතියකට ගෙන ඒම</u>**

උක්ත මැයෙන් බැංකු මූලා හා මහ සංගම් අංශය විසින් නිකුත් කල මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 19ට තුන්වන එකතුව හා බැදේ.

පොදු කේත අංක ක්‍රමයක් හදුන්වා දුන් පසු සමහරක් මහ සංගම් විසින්,එම මහ සංගම්වල පවතින විවිධ ගිණුම් පිළිබදව උපදෙස් ඉල්ලා ඇත.ඒ අනුව එම ගැටලු සදහා විසදුමක් ලෙස,පහත නව ගිණුම් සහ කේත අංක හදුන්වාදී ඇත.මෙසේ කේත අංක හදුන්වා දීමේදී ඒ ඒ මහ සංගම්වල පවතින උපදෙස් වලට පරිබාහිරව විවෘත කර ඇති සියලුම ගිණුම් සදහා කේත අංක හදුන්වා දිය නොහැකි අතර දැනට හදුන්වා දී ඇති සුදුසු ගිණුමකට එම පවතින ගිණුම් ශේෂ ඇතුලත් කල යුතුවේ.

උදාහරණයක් ලෙස, වැය ගිණුම මහ සංගම් සංවත්සරික වියදම් ලෙස මහ සංගමයේ ගිණුමක් දැනටම පවතින බවත්, **එම වැය ගිණුමේ ශේෂය හර කල යුතු ගිණුම්** පිළිබද සමහර මහ සංගම් උපදෙස් ඉල්ලා ඇත.19ට තුන්වන එකතුව මගින් හදුන්වා දී ඇති වැය ගිණුම උත්සව වියදම් (කේත අංකය 6607) යටතේ මෙම වියදම් හර කල යුතුය.

**<u>මෙහෙයුම් උපදෙස් 19 ට තුන්වන එකතුවට අළුතින්ම හදුන්වා දී ඇති ගිණුම් සහ කේත අංක පහත වේ</u>**

(1) සමෘද්ධි බැංකු සංගම් සහ මහ සංගම් ගොඩනැගිලි ඉදිකිරීම්/සංවර්ධනය සදහා සමෘද්ධි අධිකාරියෙන් ලද අරමුදල් ගිණුම - කේත අංකය 9416

(2) විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සදහා සමෘද්ධි අධිකාරියෙන් ලද අරමුදල් ගිණුම
කේත අංකය 9417

(3) විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සදහා භාහිර ආයතන වලින් ලද අරමුදල් ගිණුම
කේත අංකය 9418

(4) සමෘද්ධි අධිකාරියට යැවිය යුතු ආදායම් උත්පාදන අරමුදල් රැස්කිරීමේ ගිණුම 9419

(5) අවිනිශ්චිත ගිණුම සේවක අක්‍රමිකතා -
කේත අංක 9420

2014 වසරේ සිට විද්‍යුත් තැපැල මගින්,මහ සංගමයේ පොදු ලෙජරයේ ශේෂ පරීක්ෂණ ගෙන්වා ගැනීමට නියමිත බැවින් නිසි පරිදි කේත අංක අනුව මහ සංගමයේ පොදු ලෙජරයේ සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකරන මෙන් දන්වමි.

මෙම සංශෝධන සහිතව සමෘද්ධි වෙබ් අඩවියේ තොරතුරු ඇතුලත් කර ඇති බවද තවදුරටත් කාරුණිකව සදහන් කරමු.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

කේ.කේ.එල්.චන්ද්‍රතිලක
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහ සංගම්/ බැංකු මූල්‍ය)